දෙහිවල ගැඹුරු මුහුදේ දී කිමිදුම්කරුවෙකු කිඹුල් ප්‍රහාරයකට ලක්ව ජීවිතක්ෂයට පත්වූ පුවත, මාධ්‍ය ඔස්සේ ආවරණය වී තිබිණි. එහිදී අපගේ නිරීක්ෂණයට බඳුන් වූ ලිපි දෙකක සිරස්තල පහත ආකාරයට දැක්විය හැක.

1) "කොළඹ මුහුදේ කිඹුලා මිනිස් දඩයම අරඹයි" - සති අග අරුණ (2021-01-09)
2) "සහකාරියන් සොයා යන කිඹුලන් මරා දැමීම හරිද?" - ඉරිදා මව්බිම (2021-01-09)

මෙම "සහකාරියන් සොයා යන කිඹුලන් මරා දැමීම හරිද?" යනුවෙන් වූ ඉරිදා මව්බිම ලිපිය තුළ, කිඹුලන් මුහුදට පැමිණෙන්නේ ආහාර අවශ්‍යතා හෝ ප්‍රජනන අවශ්‍යතා සඳහා බවත්, එවැනි විටක මිනිසාට තාවකාලික තර්ජනයක් වීම නිසා කිඹුලන් විනාශ කිරීම හෝ අල්වා ආගන්තුක පරිසරයකට අත්හැරීම නොකළ යුතු බවත් දක්වා තිබිණි.

කෙසේ නමුත්, "කොළඹ මුහුදේ කිඹුලා මිනිස් දඩයම අරඹයි" වැනි සිරස්තලයක් ඔස්සේ, අනවශ්‍ය භීතියක් ජනිත වීමත්, ඒ ඔස්සේ එම සතුන්ට හානි පැමිණවීමට පවා පෙළැඹවීමක් ඇති වීමත් සිදු නොවනු ඇතිද?

ඒ අනුව, ඔබ තෝරාගන්නේ ඉහත කුමන සිරස්තලයද?